8th International Conference of Multidisciplinary Approaches (iCMA), 2021
Faculty of Graduate Studies,
University of Sri Jayewardenepura,
Sri Lanka.
ISSN: 2386 – 1509
Copyright © iCMA


# සබරගමු නර්තනයේ ශාන්තිකර්මයන්හි අන්තර්ගත සාම්ප්‍රදායික ලක්ෂණ සමකාලීන වේදිකාවට ගෙන ඒමේ දී නව ශිල්පක්‍රම හා තාක්ෂණය භාවිතය පිළිබඳ අධ්‍යයනයක්

කරුණාරත්න පී.එම්.පී.එම්.

සබරගමු නර්තන අධ්‍යයනාංශය, නර්තන හා නාට්‍ය කලා පීඨය,
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
prasadpulasingha@gmail.com

**සාරසංක්ෂේපය**

අද්‍යතන ප්‍රාසංගික කලාව තාක්ෂණික හා ශිල්ප විධික්‍රමයන්ගෙන් පොහොසත් වූවකි. දේශීය නර්තනය ජාතික හා ජාත්‍යන්තර තලයට ගෙන යාමට නම් නව ශිල්පක්‍රම හා තාක්ෂණික විධික්‍රම ඔස්සේ වඩාත් සංවර්ධනය කළ යුතු ව ඇත. අනෙකුත් දේශීය නර්තන සම්ප්‍රදායන් හා සංසන්දනය කිරීමේ දී සබරගමු නර්තන සම්ප්‍රදාය, සමාජගත වීම හා නව ප්‍රවණතාවන්ට ලක් වූවේ මන්දගාමී ව ය. ඊට හේතු වූ දේශපාලන, සංස්කෘතික, ආගමික, සමාජීය හේතු සාධක බොහොමයක් ඇති අතර ඒවා තත් සම්ප්‍රදායේ පසුගාමීත්වයට ඍජු ව බලපා ඇත. අනෙකුත් නර්තන සම්ප්‍රදායන් නව ප්‍රවණතාවන්ට ලක්වූයේ යටත්විජිත සමය හා පශ්චාත් යටත්විජිත සමයේ දී ය. එහෙත් ස්වාභාවික ව රට මැද පිහිටි සබරගමු ප්‍රදේශය විදේශීය ආක්‍රමණයන්ට හා සංක්‍රමණවලට ලක් නො වීමෙන් අද්‍යතනය දක්වා පවත්නා ප්‍රාථමික ලක්ෂණ ආරක්ෂා වී ඇත. සබරගමු නර්තනයේ භාවිත සාම්ප්‍රදායික ශිල්පක්‍රම එහි ප්‍රාසංගිකත්වය උදෙසා යම් දායකත්වයක් දක්වනු ලැබුව ද අද්‍යතන ප්‍රවණතා හමුවේ ඒවා ප්‍රමාණවත් වේ ද යන්න පිළිබඳ මෙම පර්යේෂණය මගින් සාකච්ඡා කිරීම, අරමුණු විය. මෙම පර්යේෂණය සඳහා සාහිත්‍ය මූලාශ්‍රය, නිරීක්ෂණ සහ සම්මුඛ සාකච්ඡා මගින් දත්ත රැස්කර ගන්නා ලදි. අතීතයේ ප්‍රේක්ෂකයාගේ රස විඳීමේ බුද්ධිමට්ටම අනුව ශාන්තිකර්ම ශිල්පියා විවිධ ක්‍රමෝපායන් මගින් ප්‍රාසංගිකත්වය පිළිබිඹු කරනු ලැබුව ද වර්තමාන ප්‍රේක්ෂකයාගේ අවශ්‍යතාව මත නවතාවන්ට ලක්කිරීමට සිදු ව ඇත. මේ අනුව මෙම පර්යේෂණය සම්බන්ධයෙන් ගොඩනගන ලද ප්‍රශ්නාවලියක් සකස් කොට පාරම්පරික සබරගමු ශාන්තිකර්ම ශිල්පීන් පස් දෙනෙකු හා වර්තමාන ශ්‍රී ලාංකික නව නර්තන නිර්මාණ ශිල්පීන් පස් දෙනෙකු සමග සාකච්ඡා පැවැත්වීම ද ඉන්දියාව, චීනය රුසියාව, ප්‍රංශය සහ ඇමරිකාව යන රටවල් නර්තනය සඳහා භාවිත කරන නව ශිල්පක්‍රම පිළිබඳ ව අධ්‍යයනය කිරීම ද සිදු කරන ලදි. ඒ අනුව උක්ත ගැටලුව සම්බන්ධයෙන් දත්ත රැස්කරගත් අතර එම දත්ත විශ්ලේෂණය මගින් සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්තිකර්මය වන පහන්මඩු ශාන්තිකර්මය තුළ අන්තර්ගත ප්‍රාසංගික ලක්ෂණ සාමාන්‍ය ජනයාගේ රස විඳීම සඳහා ප්‍රමාණවත් වුව ද, එම නර්තනයන් සමකාලීන වේදිකාවට ගෙන ඒමේ දී නව ශිල්පක්‍රම හා තාක්ෂණය භාවිත කිරීම වර්තමාන අවශ්‍යතාවක් බව නිගමනය විය.

**ප්‍රමුඛ පද:** *සබරගමු නර්තනය, ප්‍රාසංගිකත්වය, ශිල්පක්‍රම, නව ප්‍රවණතා, තාක්ෂණය*